ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

පළමු සමාසික අවසාන පරීක්ෂණය 2009

ළමා මනෝ විද්‍යාව- ESC 1222/1233

කාලය - පැය තුනයි.

---

දිනය - 2009.06.20 වේලාව - පෙ.ව. 09.30- ප.ව. 12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

01. "උචිත ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රියාවලියක් සංවිධානය කර ගැනීම සඳහා ළමා මනෝවිද්‍යාව පිළිබඳ දැනුම පෙර පාසල් ගුරුවරයකුට උපකාරී වේ."
නිදසුන් දක්වමින් ඉහත ප්‍රකාශනය විභාග කරන්න. (ලකුණු 20)

02. "ළමයෙකුගේ පෞරුෂයේ කැඩපත චර්යාවයි."

i. ළමුන්ගේ ප්‍රධාන චර්යා රටා දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. ළමයින්ගේ චර්යා/ක්‍රියා දහයක් හඳුනාගෙන ඒවා ඉහත දක්වන ලද චර්යා රටා දෙක යටතේ වර්ගීකරණය කරන්න. (ලකුණු 08)

iii. ළමයින්ගේ චර්යා අධ්‍යයන ක්‍රමවේදයක් වශයෙන් නිරීක්ෂණයෙහි ඇති වැදගත්කම විභාග කරන්න. (ලකුණු 10)

03. "පෙර පාසල් ගුරුවරියකගේ ඉලක්කය විය යුත්තේ පෙර පාසල් අධ්‍යාපනය තුළින් ළමයෙකුගේ සමස්ථ සංවර්ධනයක් ඇති කිරීමයි."

i. සමස්ත සංවර්ධනයේ විවිධ අංග නම් කරන්න. (ලකුණු 04)

ii. පෙර පාසල් දරුවන් තුළ ඔබ ඉහත සඳහන් කළ අංගවල සංවර්ධනයක් ඇති කිරීම සඳහා උචිත ක්‍රියාකාරකම් ඇතුළත් දිනක සමෝධානිත පාඩම් සැළැස්මක් සකස් කරන්න. මෙම පාඩම් සැලසුමෙහි;
- අදාල අරමුණු
- එම අරමුණු ඉටු කර ගැනීම සඳහා ඔබ ගන්නා ක්‍රියාමාර්ග, පැහැදිලිව දැක්විය යුතුය.

(ලකුණු 16)

04. i. වයස අවුරුදු 2 - 8 අතර දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුන නම් කරන්න. (ලකුණු 06)

ii. පෙර පාසල් දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා ඉහත සාධක බලපාන අයුරු විශ්ලේෂණය කරන්න. (ලකුණු 14)

05. "අපගේ සංවර්ධනාත්මක ලක්ෂණ බොහොමයක් ජානමය වශයෙන් සම්ප්‍රේෂණය වන සාධක සහ පාරිසරික බලපෑම් අතර සංකීර්ණ අන්තර් ක්‍රියාවෙහි ප්‍රතිඵලයක් වේ." සුදුසු උදාහරණ දක්වමින් මෙම මතය පරීක්ෂා කරන්න.

(ලකුණු 20)

06. i. සංකේතාත්මක චින්තනය යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ii. ළමයින්ගේ සංකේතාත්මක චින්තනය නියෝජනය කරන ක්‍රියා 3 ක් හඳුනාගෙන සඳහන් කරන්න.

(ලකුණු 03)

iii. බාල ළමුන්ගේ සංකේතාත්මක චින්තනය දිරි ගැන්වීම සඳහා ක්‍රියාකාරකමක් ගොඩනඟන්න. එයට පහත සඳහන් දේ අඩංගු කරන්න.

අ. ක්‍රියාකාරකමෙහි අරමුණු
ආ. භාවිතා කළයුතු ඉගෙනුම් - ඉගැන්වීම් ආධාරක
ඇ. ගුරු භූමිකාව/ක්‍රියාකාරකම්
ඇ. සිසු භූමිකාව/ක්‍රියාකාරකම්

(ලකුණු 12)

07. i. 'සංජානනය' සහ 'සංවේදනය' යන පද ඔබගේ වචනයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. සුදුසු උදාහරණ ඇසුරින් සංජානන ක්‍රියාවලිය ළමයින්ගේ ඉගෙනුමට බලපාන අන්දම සාකච්ඡා කරන්න.

(ලකුණු 14)

08. 'ෆ්‍රොයිඩ්ට අනුව තදාත්මීකරණ ක්‍රියාවලිය තුළින් ළමයින් තම දෙමව්පියන් වෙතින් සදාචාරාත්මක ඇගයුම ළඟා කර ගනී.'

i. පෙර පාසල් දරුවන්ගේ සදාචාර සංවර්ධනය පිළිබඳව ෆ්‍රොයිඩ්ගේ දෘෂ්ඨිය කෙටියෙන් සාකච්ජා කරන්න.

(ලකුණු 10)

ii. පෙර පාසල් ළමයින්ගේ සදාචාර සංවර්ධනය පිළිබඳව දෙමව්පියන්ගේ කාර්යභාරය පැහැදිළි කරන්න.

(ලකුණු 10)

09. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. පෙර පාසල් ළමයින් තුළ වඩාත් පොදු චිත්තවේග රටා
ii. විශේෂ අවශ්‍යතා සහිත පෙර පාසල් ළමුන්
iii. සමාග්‍රහණය, ප්‍රතියෝජනය සහ අනුවර්තනය ඇතුළත් මානසික ක්‍රියාවලිය

(10 x 2 = ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි. -